

### රජයේ අනුග්‍රහයෙන් ඉන්දියාවට යැවීම සඳහා

# ප්‍රභාකරන්ගේ මව කොළඹට

### රැගෙන ආවේ රතු කුරුස ගිලන් රියකින්

### ආරක්ෂාව මැද කොළඹ හෝටලයක

**එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ගේ මව වන වල්ලිපුරම් පාර්වතී මහත්මිය සිය දියණියක වෙසෙන ඉන්දියාව බලා පිටත් කර හැරීම සඳහා රජයේ අනුග්‍රහය යටතේ කොළඹට රැගෙන විත් ප්‍රධාන පෙළේ හෝටලයක නතර කර සිටී.**

ප්‍රභාකරන්ගේ මව කොළඹට රැගෙන විත් ඇත්තේ ශ්‍රී ලංකා රතුකුරුස සමාජයට අයත් WP HM 9380 දරණ ගිලන් රථයෙනි. අදාල ගිලන් රථය යාපනයේ වැල්වැටිතුරෙයි බලා පිටත්ව ගොස් ඇත්තේ පසුගිය 01 දින වන අතර 02 දා වැලවැටිතුරෙයින් පිටත්ව කොළඹට ළඟා වී ඇත. ප්‍රභාකරන්ගේ මව කොළඹට රැගෙන ඒමෙන් පසු මේ වන විට කොළඹ ප්‍රධාන පෙළේ හෝටලයක රඳවා ඇති අතර ඉදිරි දින කිහිපය තුළ ඇය සිය දියණිය වෙසෙන ඉන්දියාව බලා පිටත්කර හැරීමට සූදානමින් සිටින බව වාර්තා වේ.

මේ පිළිබඳව අප ශ්‍රී ලංකා රතුකුරුස සමාජයේ නිලධාරියකුගෙන් කළ විමසීමකදී සිය අනන්‍යතාවය හෙළි නොකරන පදනමින් යුතුව ප්‍රකාශ කළේ තම ආයතනයට කළ දැනුම්දීමක් මත රතුකුරුස සමාජයට අයත් ගිලන් රථයක් පසුගිය 01 දා යාපනය බලා පිටත් කර හැරිය බවය. අදාල ගිලන් රථය මාර්තු 02 දා නැවත කොළඹ බලා පැමිණි අතර අදාළ ගිලන් රථයෙන් ප්‍රභාකරන්ගේ මව කොළඹට රැගෙන ආ බව සත්‍යයක් බවය.

ප්‍රභාකරන්ගේ පියා වන තිරුවෙන්ගඩම් වේලුපිල්ලේ මහතා හමුදා භාරයේ සිටියදී මිය යෑමෙන් පසුව ඔහුගේ දේහය හා ප්‍රභාකරන්ගේ මව සිය භාරයට ගනු ලැබූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. සිවාජිලිංගම් මහතාගෙන්ද අප මේ පිළිබඳව විමසීමක් කළෙමු. එහිදී සිවාජිලිංගම් මහතා ප්‍රකාශ කරන ලද්දේ ප්‍රභාකරන්ගේ මව සිය භාරකාරත්වයට ගනු ලැබීමෙන් පසු පසුගිය කාලය තුළ යාපනයේ වැල්වැටිතුරෙයි ප්‍රදේශයේ ජීවත් වන බවය. එහිදී ඇය පසුගියදා කොළඹට කැඳවාගෙන පැමිණියේද යන්න විමසූ විට ශිවාජිලිංගම් මහතා ඒ පිළිබඳව ප්‍රථමයෙන්ම ඍජු පිළිතුරක් නොදුන් නමුත් පසුව සඳහන් කරන ලද්දේ ඇය වැඩිපුර වෛද්‍ය ප්‍රතිකාර සඳහා කොළඹට රැගෙන විත් ආපසු යාපනය බලා කැඳවාගෙන ගිය බවය.

එහෙත් අප වෙත ලැබී ඇති තොරතුරු අනුව පුවත්පත මුද්‍රණයට යන අවස්ථාවේදීත් ඇය කොළඹ එක්තරා හෝටලයක ලැගුම් ගෙන සිටි අතර ඉදිරි දින කිහිපය තුළදී රජයේ පූර්ණ සහය ඇතිව ඉන්දියාව බලා පිටත් කර හැරීමට නියමිතය.

### ● භාණ්ඩ හා සේවා මත බදු බර වැඩිකිරීමෙන්

# මහ මැතිවරණයෙන් පසු බඩුමිල තවත් ඉහළට

මහමැතිවරණය නිමවීමත් සමග දැනට පහළ වැටී ඇති රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමේ අරමුණින් භාණ්ඩ හා සේවා මත විශාල බදු බරක් පැනවීමට රජය තීරණය කොට ඇත. මේ සඳහා සිදු කළ යුතු බදු ව්‍යුහයේ වෙනස්කම් ඇතුළත් වාර්තාව මේ වනවිටත් ජනාධිපතිවරයා වෙත ලබා දී ඇති බව දැනගන්නට තිබේ.

වත්මන් බදු ව්‍යුහය නැවත සළකා බැලීමට හා බදු ආදායම් වැඩි කර ගැනීමේ නව මාර්ග සෙවීම සඳහා පසුගිය වසරේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද ජනාධිපති බදු කොමිසම මගින් මෙම වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කොට ඇත.

අදාළ වාර්තාව මගින් පෙන්වා දී ඇත්තේ 2009 වසර සඳහා වූ රාජ්‍ය ආදායම වූ රුපියල් බිලියන 65.7 ක් මුදල තවත් රුපියල් බිලියන 12.2 කින්, එනම් රුපියල් බිලියන 77.9 දක්වා ඉහළ නංවා ගැනීමට අදාළ යෝජනාවන්ය.

එමෙන්ම 2010 වර්ෂය සඳහා වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් බිලියන 320 සිට රුපියල් බිලියන 443 දක්වා ඉහළ නංවා ගැනීමට අවශ්‍ය යෝජනාවන්ද මෙම වාර්තාවට ඇතුළත් කොට ඇති බව දැනගන්නට අත. මේ අනුව ලබන පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අය-වැය ලේඛනය මගින් අතිවිශාල වශයෙන් බදු පැනවෙනු ඇති බවත්, ඒ හේතුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ඇතුලු භාණ්ඩ හා සේවා රැසක මිල ගණන් ඉහළ යනු ඇති බවත් ආර්ථික විශ්ලේෂක යන්ගේ මතය වී තිබේ.

# සනත්ට ජන්දෙට වඩා අයි.පී.එල්. සල්ලි ලොකු වෙලා



ගාල්ල දිස්ත්‍රික්කයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ මෙවර මහ මැතිවරණයට තරග වදින 40 හැවිරිදි ජ්‍යෙෂ්ඨ ක්‍රිකට් ක්‍රීඩක සනත් ජයසූරිය මහතා මැතිවරණය පැවැත්වෙන අප්‍රේල් 08 වන දින ද ශ්‍රී ලංකාව තුළ රැඳී නොසිටින බව වාර්තා වේ.

එම මාසය ඇතුළත ඉන්දියාවේ ප්‍රකට ක්‍රිකට් තරගාවලියක් වන අයි.පී.එල්. තරඟාවලිය සඳහා සනත් ජයසූරිය සහභාගී වී සිටීම මේ සඳහා හේතු වී තිබේ.

ඉන්දීය ආරංචි මාර්ග සඳහන් කරන්නේ මෙම අයි.පී.එල්. තරගාවලියට සහභාගි වීම සඳහා මේ වන විටත් සනත් ජයසූරිය රුපියල් කෝටි ගණනාවක ගිවිසුම්වලට අත්සන් තබා ඇති බවකි.

මීට අමතරව පාර්ලිමේන්තු මැතිවරණය නිමාවීමෙන් අනතුරුවද එක දිගට ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම හට විදෙස් සංචාරයන් සඳහා සහභාගි වීමට සිදුවන හෙයින් සනත් ජයසූරියටද දේශපාලනය කිරීම පසෙක තබා මෙම තරගවලට සහභාගී වීමට සිදුව තිබේ.

කෙසේ වෙතත් සනත් ජයසූරිය දේශපාලනයට පිවිසෙමින් කියා සිටියේ තමා දේශපාලනයේ දිගටම නිරත වූවද ලබන 2011 වසරේ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය සඳහා සහභාගි වීමටද සූදානමින් සිටින බවකි.

# මිහින් ලංකා තව කෝටි ගණනාවක් ගිලින්න සූදානමක

එක් වසරක් ඇතුළත රුපියල් මිලියන 3200 ක අතිවිශාල පාඩුවක් ලැබූ මිහින් ලංකා ගුවන් සේවය තවත් රුපියල් කෝටි ගණනාවක් වැය කොට චීන රජයෙන් නව ගුවන් යානා දෙකක් මිලට ගැනීමට සූදානම් වන බව Flight Global an Aviation News වෙබ් අඩවිය වාර්තා කර ඇත. ඒ අනුව චීනයේ නිෂ්පාදිත Xian Ma 60 වර්ගයේ ගුවන් යානා දෙකක් මෙම වසර ඇතුළත මිලදී ගැනීමට මිහින් ලංකා ගුවන් සේවය කටයුතු යොදා තිබේ.

2007 වර්ෂයේදී කැබිනට් පත්‍රිකාවක් හෝ ඉදිරිපත් නොකරමින් ආරම්භ කළ මෙම මිහින් ලංකා ගුවන් සේවයේ ආරම්භක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේ මෙවර මහමැතිවරණය සඳහා ගාල්ලෙන් ඉදිරිපත්ව සිටින දකුණු පළාත් සභා මන්ත්‍රී සජින් වාස් ගුණවර්ධන මහතාය. ඔහුගේ පරිපාලනය යටතේ මිහින් ලංකා ගුවන් සේවය රුපියල් මිලියන 3200 ක් විනාශ කොට තිබිණ.

ඒ අනුව වසා දැමූ මිහින් ලංකා ගුවන් සේවය නැවත ආරම්භ වූයේ ඉකුත් අය-වැය මගින් ජනාධිපතිවරයා විසින් රුපියල් මිලියන 6000 ක් වෙන් කිරීමෙන් අනතුරුවය. නමුත් ඉන් පසුවද මිහින් ලංකා ගුවන් සේවය දෛනිකව රුපියල් මිලියන ගණනින් අලාභ විඳිමින් පවත්වාගෙන යෑමට රජය කටයුතු කළේය.

කෙසේ වෙතත් 2009 ජනවාරි 15 වැනි දින නිකුත් වූ නවතම වාර්තාවකින් කියවුණේ මිහින් ලංකා ගුවන් සේවයේ ගමන් කරන මගීන්ගේ ප්‍රතිශතය එහි ආසන සංඛ්‍යාවෙන් ගත් විට 23% ක් බවය. එමෙන්ම මිහින් ලංකා ගුවන් සේවය දිනකට ගුවන් පැය 50 ක් පමණ අපතේ යවා ඇති බවත්, ඒ වෙනුවෙන් ට්‍රාන්ස්වෙයා ගුවන් සමාගමට ඇමෙරිකානු ඩොලර් 2890ක් ගෙවිය යුතු බවත් එම වාර්තාවේ සඳහන්ව තිබිණි.

MIHIN LANKA
Yours to fly

### ලක්ෂමන් සෙනෙවිරත්නගෙන් හමුදාවට ප්‍රකාශයක්

# ජනරාල් ෆොන්සේකා රාජකාරී කරද්දී ම දේශපාලන සබඳතා පවත්වා ගත්තා



ජනරාල් සරත් ෆොන්සේකා මහතා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරයේ රාජකාරී කරමින් සිටියදීම තමා සමග සබඳතා පැවැත්වූ බව එක්සත් ජාතික පක්ෂයේ බදුල්ල දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා අනාවරණය කොට තිබේ.

ජනරාල් සරත් ෆොන්සේකා මහතාට එරෙහිව සිදු කරන සාක්ෂි විමසීමේදී යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජනරාල් දයා රත්නායක මහතා ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා මේ බව සඳහන් කොට ඇත.

එහිදී සෙනෙවිරත්න මහතා ප්‍රකාශ කොට ඇත්තේ මාධ්‍යවේදියකු අත තමා වෙත එවන ලද ජනරාල් ෆොන්සේකා මහතාගේ පෞද්ගලික සී.ඩී.එම්.ඒ. දුරකතනයක් හරහා මෙම සාකච්ඡාව සිදුවූ බවකි.

මෙම සාකච්ඡාවේදී ජනරාල් සරත් ෆොන්සේකා මහතා තමාට ඉහළින් සිටින බලවතුන් විවේචනයට ලක් කළ බවත්, දේශපාලනයට පිවිසීම සඳහා තමන් තුළ ඇති බලාපොරොත්තු සහ වෙනත් කරුණු පිළිබඳව තොරතුරු සාකච්ඡා කළ බවත් සෙනෙවිරත්න මහතා අනාවරණය කොට තිබේ.

ජනරාල් සරත් ෆොන්සේකා මහතා යුද අධිකරණයකට ඉදිරිපත් කිරීම සඳහා මේජර් ජනරාල් දයා රත්නායක විසින් කොළඹ කොටුව නාවික හමුදා මූලස්ථානය තුළදී සිදුකළ සාක්ෂි එක්රැස් කිරීමකදී ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා මේ බව ප්‍රකාශ කළ බව පසුගිය සතියේ සන්ඬේ ටයිම්ස් පුවත්පත වාර්තා කර තිබිණි.

# විමල්ගේ තේමා පාඨය ජනතාව නිවැරදි කරයි



මෙවර මහමැතිවරණය සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග වදින ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා විසින් කොළඹ දිස්ත්‍රික්කය පුරා ඔසවා ඇති 'මව්බිමේ පංචායුධය' යනුවෙන් ගැසූ කටවුට්වල ඇති '0' අක්ෂරය මහජනතාව විසින් මකා දමා ඇති බව වාර්තාවේ. ඒ අනුව විමල් වීරවංශ මහතාගේ මැතිවරණ තේමාපාඨය වන 'මව්බිමේ පංචායුධය' මේ වනවිට 'මව්බිමේ පචායුධය' බවට පත්ව තිබේ. මේ සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාන ගණනාවකින්ම විමල් වීරවංශ මහතා වෙත තොරතුරු ලැබීමෙන් අනතුරුව එසේ 'මව්බිමේ පචායුධය' වශයෙන් දැක්වෙන කටවුට් ගණනාවක්ම ඔහු විසින් ගලවා ඉවත් කිරීමට කටයුතු කොට ඇති බව දැනගන්නට ඇත.